)වීඥම් ඇවීලු!දි ට්චිරිමිවී
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. -
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 හුදකලාවම බරණැස ඉසිපතනය බලා වැඩම කළ බුදුන් වහන්සේට බෝමැඩටත් ගයාවටත් අතරදී මුණගැසුනේ,
(1) භද්දවග්ගිය කුමාරවරු ය. (2) උපක ආජීවකයා ය.
(3) සොණදණ්ඩ බමුණා ය. (4) යසකුල පුත්‍රයා ය.

02 විශාලා මහනුවර තුන්බිය දුරුකිරීමට බුදුන්වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
(1) මෙත්ත සූත්‍රයයි. (2) මංගල සූත්‍රයයි. (3) රතන සූත්‍රයයි. (4) සිඟාලෝවාද සූත්‍රයයි.

03 කරණීයමෙත්ත සූත්‍රයේ දී අන් අයට මෛත්‍රී කළයුතු ආකාරය පෙන්වා දී ඇත්තේ,
(1) මව දරුවකු රකිනා ලෙසය. (2) දරු සෙනෙහස ලෙසිනි.
(3) මව් සෙනෙහස ලෙසය.
(4) එක දරුවකු ඇති මවක දිවිහිමියෙන් එම දරුවා රකින ලෙසය.

04 ගිහි සමාජයේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය දිවිහිමියෙන් රකින්නා වූ ගේහසිත සීලය වන්නේ,
(1) පංච සීලයයි. (2) අෂ්ටාංගික සීලයයි.
(3) දස සීලයයි. (4) ආජීව අෂ්ටමක සීලයයි.

05 ඉතා හොඳින් ඉගෙන ගැනීම
(1) ගුරුවරයාගේ යුතුකමකි. (2) ශිෂ්‍යයාගේ යුතුකමකි.
(3) දෙමාපියන්ගේ යුතුකමකි. (4) මිතුරාගේ යුතුකමකි.

06 බුදුන්වහන්සේගේ ධර්මය මුල, මැද, අග මැනවින් දේශනා කර ඇති නිසා
(1) ස්වාක්කාත නම් වේ. (2) සන්දිට්ඨික නම් වේ.
(3) අකාලික නම් වේ. (4) ඒහිපස්සික නම් වේ.

07 විශාඛා සිටුකුමරියගේ පියාගේ නම වන්නේ,
(1) මෙණ්ඩක සිටුතුමා ය. (2) ධනංජය සිටුතුමා ය.
(3) මිගාර සිටුතුමා ය. (4) අදින්නපුබ්බක සිටුතුමා ය.

08 පළමු ධර්ම සංගායනාවේ දී මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ වන්නේ,
(1) සැරියුත් මහරහතන් වහන්සේ ය. (2) උපාලි මහරහතන් වහන්සේ ය.
(3) මුගලන් මහරහතන් වහන්සේ ය. (4) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.

09 දස කුසල්, දස පුණ්‍ය ක්‍රියා ආදිය බුදු දහමේ
(1) චාරිත්‍ර සීල නම් වේ. (2) වාරිත්‍ර සීල නම් වේ.
(3) ඉන්ද්‍රිය සංවර සීල නම් වේ. (4) ප්‍රාතිමෝක්ෂ සංවර සීල නම් වේ.

10 ශ්‍රී ලංකාවේ භික්ෂු සමාජයේ ආරම්භය සිදුවූයේ,
(1) භණ්ඩුක උපාසකගේ පැවිද්දෙනි. (2) පස්වග තවුසන්ගේ පැවිද්දෙනි.
(3) මහා අරිට්ඨ කුමරු ඇතුළු පිරිසගේ පැවිද්දෙනි. (4) යස ඇතුළු පිරිසගේ පැවිද්දෙනි.

11 ජීවිත විනාශ කිරීමෙන් වැළකී සිටීම පන්සිල්වල
(1) පළමු ශික්ෂා පදයයි. (2) දෙවන ශික්ෂා පදයයි.
(3) තුන්වන ශික්ෂා පදයයි. (4) පස්වන ශික්ෂා පදයයි.

12 බුදුන්වහන්සේ තම ආරාමයට වැඩමකරන බව දැක තම අනුගාමික පිරිස නිශ්ශබ්ද කරගත් අන්‍යාගමික නායකයා
(1) අම්බට්ඨ මානවකයා (2) පොට්ඨපාද පිරිවැජියා
(3) සෝණදණ්ඩ බමුණා (4) චංකී බ්‍රාහ්මණයා

13 මාලිගාවිල, කුෂ්ටරාජ ගල වැනි ස්ථානවල දක්නට ඇති මූර්තියකි
(1) සමාධි පිළිමය (2) හිටි පිළිමය (3) බෝධිසත්ව රූප (4) සැතපෙන පිළිමය

14 උදේන රජුගේ අන්තඃපුර බිසෝවරුන්ගෙන් සිවුරු පන්සීයක් ලබාගත්තේ,
(1) මුගලන් හිමියන් ය. (2) සැරියුත් හිමියන් ය.
(3) දේවදත්ත හිමියන් ය. (4) ආනන්ද හිමියන් ය.

15 ඉවසීම සම්බන්ධයෙන් බෝසත් චරිතයෙන් ගතහැකි හොඳම නිදර්ශනය
(1) තේමිය ජාතකයයි. (2) ක්ෂාන්තිවාදී ජාතකයයි.
(3) වෙස්සන්තර ජාතකයයි. (4) මඛාදේව ජාතකයයි.

16 සත්වයා සසර සැරීමට හේතුව ලෙස බුදුන් වහන්සේ දේශනා කර වදාළේ
(1) නැවත නැවත ඉපදීම සැපදායක නිසා (2) චතුරාර්ය සත්‍ය නොදැනීම නිසා
(3) සමාධිය ඇති නිසා (4) කර්මය හා පුනර්භවය නොදැනීම නිසා

17 ''තම පොත්පත් රැගෙන නියම තැන්වල ඉඳගෙන
ගෝසා නොකර මින කරනු පාඩම් සිතට ගනිමින''
ඉගෙනීම සම්බන්ධ සිරිත් විරිත් සඳහන් මෙම පද්‍ය ඇත්තේ
(1) සිරිත් මල්දමේ ය. (2) ගුත්තිල කාව්‍යයේ ය.
(3) ලෝවැඩ සඟරාවේ ය. (4) සුභාෂිතයේ ය.

18 ''දැන් ඔබවහන්සේ පිරිනිවන් පෑමට සුදුසු කාලය පැමිණ තිබෙන බැවින් පිරිනිවන් පාන්නැයි ඉල්ලීමක් කළේ''
(1) ආනන්ද හිමියන් ය. (2) මල්ල රජදරුවන් ය.
(3) මාර දිව්‍ය පුත්‍රයා ය. (4) පස්වග මහණුන් ය.

19 බුදුන්වහන්සේ කළගුණ සැලකීම ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවක් නොවන්නේ,
(1) අනිමිස ලෝචන පූජාව පැවැත්වීම
(2) මවට දහම් දෙසා සුවපත් කිරීමට තව්තිසා දෙව්ලොවට වැඩමවීම.
(3) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ ආදාහන පෙරහැරෙහි පසුගමන් කිරීම.
(4) ඡන්න භික්ෂුවට බ්‍රහ්ම දණ්ඩය පැනවීම.

20 අටමහ පින්කම්වලට අයත් නොවන්නකි
(1) තොරන් සෑදීම. (2) ආවාස තනවා පූජා කිරීම.
(3) බුද්ධ ප්‍රතිමා කරවීම. (4) වැසිකිළි තනවා පූජා කිරීම.

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) දුක හෝ සැප ලබාදෙන නියාම ධර්ම පහෙන් කාලගුණ විද්‍යාත්මක නියාම ධර්මය කුමක් ද?
(2) දන්සිල් භාවනා පින් දෙනු අනුමෝදනා
බණසනු දේසනා පිදිය යුත්තන් පුදනු සමනා මෙම පද්‍ය අඩංගු කෘතිය නම් කරන්න.
(3) දස පුණ්‍ය ක්‍රියාවල ''වෙයාවච්ච'' යනු කුමක් ද?
(4) ''උට්ඨානවතෝ සතිමතෝ ...'' යන ගාථාව දේශනා කළේ කාටද?
(5) තමා උපමා කරගනිමින් ලෝකයා කෙරෙහි හිතානුකම්පී වීම හඳුන්වන්නේ කෙසේද?
(6) කුඹුරුවල අස්වනු නෙලාගත්විට එහි මුල් කොටසින් පිසින ලද දානය හඳුන්වන නම කුමක් ද?
(7) ''අත්තිබලි'' යනු කුමක් ද?
(8) සිරිත් විරිත් යනු මොනවා ද?
(9) බුදුගුණාලංකාරයේ කතුවරයා කවුද?
(10) චතුරාර්ය සත්‍යයේ විශේෂ ලක්ෂණ තුනෙන් ''තථ'' ලක්ෂණය යනු කුමක් ද?

02 (1) තමා සතු දේ නිසි පරිදි කළමනාකරණය කරගැනීමේ දී උපමාවට ගත් පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
(2) ඒ දෙදෙනා කෙටියෙන් හඳුන්වන්න.
(3) ඔබේ අධ්‍යාපනික උපකරණ පරිහරණයේ දී සහ නඩත්තුවේ දී ඔබ සැලකිල්ලට ගන්නා කරුණු ලියා දක්වන්න.

03 (1) ධනය විනාශවන ක්‍රම 6 ක් පිළිබඳව බුදුන්වහන්සේ දේශනා කළ සූත්‍රය නම් කරන්න.
(2) ඉන් තුනක් නම් කරන්න.
(3) ධනය විනාශ නොවීම සඳහා ඔබ කළයුත්තේ කුමක්දැයි එම කරුණු හය ඇසුරින් පැහැදිලි කරන්න.

04 (1) ''උට්ඨානවතෝ සතිමතෝ'' ගාථාව සම්පූර්ණ කරන්න.
(2) එහි සඳහන් යසස වැඩෙන කරුණු තුනක් ලියන්න.
(3) කුම්භඝෝෂක කථාව කෙටියෙන් ලියා දක්වන්න.

05 (1) සීලයෙහි විරමණය හා සමාදානය යන අංග දෙක කෙටියෙන් හඳුන්වන්න.
(2) ත්‍රිකෝටික පාරිශුද්ධි සීලය හඳුන්වන්න.
(3) උදාර ජීවිතයක් සඳහා සිල්වතකු වීමේ වැදගත්කම පහදන්න.

06 (1) බුදුන්වහන්සේ පළමුවරට චතුරාර්ය සත්‍ය ලෝකයාට දේශනා කළ සූත්‍රය නම් කරන්න.
(2) චතුරාර්ය සත්‍යයේ විශේෂ ලක්ෂණ තුන නම් කරන්න.
(3) දුක හටගැනීමට හේතුව පහදන්න.

07 (1) බුදු දහමට අනුව අපට දුක හෝ සැප ලබාදෙන නියාම ධර්ම පහෙන් දෙකක් නම් කරන්න.
(2) බුදුන්වහන්සේ ''එලුපජීවී'' සූත්‍රයේ පුද්ගලයන් කොටස් හතරකට බෙදා කර්ම විපාක ලැබෙන අන්දම පෙන්වා දී ඇත. ඉන් තිදෙනෙක් නම් කරන්න.
(3) ''ලෝණඵල'' සූත්‍රයේ පෙන්වා දී ඇති ලුණු කැට උපමාව පැහැදිලි කරන්න.